(7)

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 පුනර් පරීක්ෂණය - 2019 දෙසැම්බර්/2020 ජනවාරි
Bachelor of Arts General (External) Degree Part II Repeat Examination 2015 – Dec. 2019/Janu. 2020

සිංසා 3.2 - නූතන ප්‍රබන්ධකථා කලාව
SLG 3.2 - Modern Fiction

කාලය පැය තුන යි

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) වන සේ තෝරා ගෙන ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න**
**නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය**

---

## පළමු කොටස

01. ආරම්භක සිංහල ප්‍රබන්ධකථාකරුවන් නවකථා මාධ්‍යය ග්‍රහණය කර ගැනීමට අපොහොසත් ව ඇති ආකාරය නිදසුන් මගින් පරීක්ෂා කරන්න.

02. සාම්ප්‍රදායික සංකල්ප හා බැඳුණු අවිශ්වසනීය අද්භුත සිදුවීම් නවකථා රචනයට යොදා ගැනීම පිළිබඳ ව ඔබ දරන මතය පැහැදිලි කොට මුල්කාලීන සිංහල ප්‍රබන්ධකථාකරුවන්ගේ නිර්මාණවල දක්නට ලැබුණු එබඳු අවස්ථා පිළිබඳ විචාරයක් කරන්න.

03. ප්‍රාරම්භක සිංහල ප්‍රබන්ධකථාවේ නිරූපිත ස්ත්‍රී චරිත තුළ විද්‍යමාන කාරකත්ව ලක්ෂණ පිළිබඳ විවරණයක යෙදෙන්න.

04. "කෙටිකතාව සුවිශේෂ කලාංගයක් වන්නේ කොට කතාවක් වීම නිසා ම නොවේ." සාකච්ඡා කරන්න.

## දෙවන කොටස

05. "මාර්ටින් වික්‍රමසිංහගේ '<u>යුගාන්තය</u>' යනු ශ්‍රී ලාංකේය දේශපාලනයේ ආධ්‍යාත්මික දරිද්‍රතාවෙහි පිළිබිඹුවකි." සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

06. සම්පත් බෙදී යාමේ විෂමතාව "සහෝදර සබඳතා" නාශනයට උපස්තම්භක වන අයුරු <u>චරිත තුනක්</u> නවකථාව ඇසුරෙන් විමර්ශනය කරන්න.

07. "සංකේත නිරූපණය <u>ලෝමාලිකා</u> කෙටි නවකථාවේ සාරාර්ථය සමග බැඳී තිබේ." විමසන්න.

08. "ජාතිවාදය යනු විසකුරු දෘෂ්ටිවාදයකි" <u>මගේ පරෙයි කූඩුව</u> කෙටිකතාව ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

********************************************